# කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

## 1. විධායක සාරාංශය

වර්තමාන කෘෂිකර්මාන්තය බොහෝ දුරට රඳා පවතින්නේ රසායනික පොහොර, පළිබෝධනාශක සහ වල් නාශක වැනි කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය මත ය. මෙම රසායනික ද්‍රව්‍යයන් ගොවිබිම් වලින් කාන්දු වන අතර වර්තමාන හා අනාගත පරපුර සඳහා කෙටිකාලීන හා දිගු කාලීන පාරිසරික හා සෞඛ්‍ය ගැටලු නිර්මාණය කරමින් ස්වාභාවික භූගත ජලය දූෂණය කරයි. අප රටේ ප්‍රධාන වශයෙන් ගොවි බිම් ආශ්‍රිතව නාඳුනන හේතු නිසා ඇති වී තිබෙන නිදන්ගත වකුගඩු රෝගය බරපතල සෞඛ්‍ය ගැටළුවක් වී ඇති අතර මෙම හේතුව නිසා බොහෝ දෙනා රෝගයට ගොදුරු වීමෙන් මරණයට පවා පත්ව ඇත. මෙම නිධන්ගත වකුගඩු රෝගය සඳහා අධික කෘෂි රසායන භාවිතය සහ රසායනික පොහොර භාවිතය සමඟ සම්බන්ධයක් ඇති බවට විශ්වාස කෙරේ. එපමණක් නොව රෝගයට ගොදුරු වූවන්ට හට ඖෂධ සහ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා මහජන මුදල් මිලියන ගණනක් වැය වන අතර එය රටේ ආර්ථිකයට අමතර බරක් වී ඇත. මෙලෙස ජල දූෂණයට පිළියම් යෙදීම සඳහා ආර්ථික වශයෙන් ශක්‍ය නිවැරදි කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම ගැටලුවේ බරපතලකම තවත් උග්‍ර කරන අතර ජීවීන්ගේ අභිවෘද්ධිය සඳහා වඩාත් පරිසර හිතකාමී බෝග නිෂ්පාදන ක්‍රම කරා ගමන් කිරීමේ වැදගත්කම තවදුරටත් අප හට අවධාරණය කරයි.

රසායනික පොහොර ප්‍රමාණය අඩු කිරීම සඳහා කාබනික ගොවිතැන මෙන්ම පසට කොම්පෝස්ට් පොහොර එකතු කිරීම මඟින් පාංශු ව්‍යුහය හා වයනය වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන අතර එය කාබන් ගබඩා කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර පෝෂ්‍ය පදාර්ථ රඳවා තබා ගැනීමට සහ ලබා ගැනීමට දැඩි ලෙස බලපෑම් කරයි. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පරිසරයට , සමාජයට හා කෘෂිකර්මාන්තයට ප්‍රයෝජන ගණනාවක් ලබාදෙන ක්‍රියාවලියකි. බෝග වගාවේදී කොම්පෝස්ට් ඉතා අනර්ඝ පෝෂණ ප්‍රභවයක් ලෙස හැඳින්විය හැකි අතර ඉහල ඵලදායීතාවයක් ලබා ගැනීම සඳහා රසායනික පොහොර සමඟ කාබනික පොහොර භාවිතා කිරීම හරහා ඉතා ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි බවටද පරික්ෂණයන් හරහා තහවුරු කොට ඇත. දීර්ඝ කාලීනව කාබනික පොහොර භාවිතා කිරීම හරහා පාංශු භෞතික, රසායනික සහ ජෛවීය ලක්ෂණද වැඩි දියුණු වීම සිදු වේ. එමෙන්ම නාගරික පරිසරයකදී මෙය අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බෙහෙවින් උපකාරී වේ. අපද්‍රව්‍ය ක්‍රමවත්ව කළමනාකරණය සිදු කරන ක්‍රමවේදයක් ලෙස කොම්පෝස්ට් නිෂ්පාදනය හැඳින්විය හැක.

**<u>කොම්පෝස්ට් නිෂ්පාදනය හරහා පරිසරයට ඇති ප්‍රයෝජන</u>**

- අපද්‍රව්‍ය කළමනාකරණයට අවස්ථාවක් උදාවීම
- අපද්‍රව්‍ය වල අන්තර්ගත රෝගකාරක හා වල්පැලෑටි බීජ විනාශ වීම
- පරිසරය පිරිසිදුව තබා ගැනීමට ඇති හැකියාවක් ලැබීම
- පරිසරය මෙන්ම භූගත ජලය දූෂණය අවම වීම

කොම්පෝස්ට් භාවිතය නිසා පසේ සාරවත්භාවය ඉහළ යන අතර ඉහළ අස්වැන්නක් ලැබීම හරහා ආර්ථික වාසි හිමි වේ. මෙමගින් ශාක පෝෂක සමතුලිතව බෝග වලට ලබා ගැනීමේ හැකියාව ඉහළ යන අතර රසායනික පොහොර වල කාර්යක්ෂමතාවයද ඉහළ නංවා ගත හැක. එමෙන්ම පාංශු ඛාදනය අවම වන අතර පාංශු මහා ජීවීන්ගේ සහ ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරීත්වයද ගහණයද ඉහළ නංවා ගත හැක.

## 2. ක්‍රියාත්මක කරන ආයතනය පිළිබඳ විස්තර

1972 අංක 11 දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව 1978 පෙබරවාරි මස 02 වන දින නිකුත් කරන ලද අංක 302/12 දරණ අතිවිශේෂ ගැසට් නියෝගය මගින් ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ස්ථාපනය කර ඇත. උක්ත ගැසට් නිවේදනය මගින් පහත කාර්යන් ඉටු කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන ලබා දී ඇත.

1. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය හා පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමණාකරනය සඳහා සැලසුම් සකස් කිරිම හා ක්‍රියාත්මක කිරිම.
2. සංස්ථාව වෙත සතු කරන ලද ඉඩම් වල උපරිම ඵලදායීතාව, පරිසරය රැකීම ඉඩම් හා ජල සම්පත් සංරක්ෂණය හා ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයන් කළමනාකරණය.
3. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරිම හා අලෙවිකරණය.
4. කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා විවිධ උපකරණ සැපයීම හා නඩත්තු කිරිම.

ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ආයතනය බිහිවීම සඳහා හේතු වුයේ 1950 කාලයේ ඇතිවූ දේශපාලන හා සමාජ වෙනස්කම් නිසාත් වෙළඳපලේ තේ මිල සීඝ්‍රයෙන් අඩු වීම නිසාත් තේ වතු විශාල වශයෙන් නඩත්තු නොකර අත්හැරීම නිසාවෙනි. එසේම ඒහි ප්‍රතිඵලයක් ලෙස තේ වතු වල ආර්ථික වැදගත්කම අඩුවන්නට වූ අතර ඉඩම් නඩත්තුව දුර්වල වීම හේතුවෙන් සෝදා පාළුවට වැඩි වී එම ඉඩම් තවදුරටත් නිසරු තත්වයට පත්වීම ආරම්භ වූ අතර එයින් පාරිසරික වශයෙන්ද ගැටළු පැන නගින්නට විය. එමෙන්ම මධ්‍යම කඳුකරයේ වැවිලි ආර්ථිකය නිසා පාරම්පරික ඉඩම් අහිමි විශාල පිරිසක් බිහිව තිබීමත් අධික ජනගහනය නිසාම රැකී රක්ෂා ආදායම් මාර්ග අහිමි හා ඉඩකඩම් අහිමිව අසහනයෙන් පෙලෙන ජනතාවක් ජීවත් වීමත් මත සංකීර්ණ ගැටළු ගණනාවක් තේ වතු ආශ්‍රිත මැදරට ප්‍රදේශයේ පැන නැඟෙන්නට විය.

මෙහිදී එම නොසලකා හරින ලද ඉඩම් සඳහා විකල්ප ඉඩම් පරිභෝජන රටාවක් හඳුන්වා දීමට ඇති අවශ්‍යතාවය මෙන්ම ඉඩම් අහිමි ජනතාවට ඉඩමක අයිතිය ලබාදීමටත් තේ වගාවට ඇති ප්‍රමුඛතාවය වෙනුවට බෝග විවිධාංගීකරණය තුළින් යම් විසඳුමක් ලබා දීමත් මධ්‍යම කඳුකරයේ ඇති වෙමින් පැවතුන ජලමූලාශ්‍ර වල සුරක්ෂිත බව පිරිහීමට විසඳුමක් ලෙසත් "NADSA" ව්‍යාපාරය ආරම්භ විය.

1978 වසරේදී අක්කර 26000 ක් පමණ ව්‍යාපාරය වෙත පවරා කටයුතු ආරම්භ කිරීම සිදුකරන ලදී. එයින් අක්කර 15000ක් පමණ වන වගාව සඳහා යොමු කරන ලද අතර ඉතිරි ඉඩම් ප්‍රමාණය ගොවි පවුල් 6000ක් අතරේ බෙදාදෙමින් සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී. මෙම කටයුතු සඳහා අන්තර්

ජාතික සංවර්ධන අරමුදලින් ණය ආධාර ලැබුණද ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය තුල ඇති වූ යම් යම් අඩුපාඩුකම් නිසා එම අරමුදල 1982 දී තම දායකත්වය ඉවත් කර ගන්නා ලදී. ඉන්පසු රාජ්‍ය භාණ්ඩාගාර අරමුදල් මඟින් නව කළමනාකාරීත්වයක් යටතේ ඉඩම් සංවර්ධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සිදුවිය.

පසුව එම වැඩසටහන් වල පැවති සාර්ථකත්වය නිසාම 1989දී ලෝක ආහාර සංවිධානයේ අනුග්‍රහය මත පස් අවුරුදු කාලයක් පුරා ලෝක ආහාර සංවිධානයේ ආධාර ඉඩම් හිමි ජනපදිකයින් හට තම ඉඩම සංවර්ධනය කරගැනීම වෙනුවෙන් රුපියල් 2500 ක ආහාර සලාකයක් ලබාදීමට හැකිවිය. එමෙන්ම මහ භාණ්ඩාගාරයේ මුල්‍ය ප්‍රතිපාදන මත ජනපදවාසීන්ගේ සියළුම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදුවිය.ඒ යටතේ නිවාස, මාර්ග සංවර්ධනය, ජල පහසුකම් වැඩිදියුණු කිරීම, වැසිකිළි පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඉඩම් සංවර්ධනයට අවශ්‍ය සියළු පහසුකම් (රෝපණ ද්‍රව්‍ය, පොහොර,කෘෂි උපකරණ, තාක්ෂණික දැනුම) ආදිය ලබා දෙන ලදී. මේ තුලින් 1994 වර්ෂයේ ලෝක ආහාර ව්‍යාපෘතිය අවසන් වන විට ගොවි ගම්මාන බිහිකිරීමේ වගකීම ඉතාම සාර්ථකව ඉටු කිරීමට NADSA ව්‍යාපාරයට හැකි විය.

මෙලෙස ජනතාවගේ ඉඩම් හිමිකම ලබාදීම, සියළුම නිවාස ඇතුළු යටිතල පහුකම් වැඩිදියුණු කිරීම, ඉඩම් සංවර්ධනය සහ ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබාදීම, ආර්ථික සංවර්ධනය සඳහා සත්ව පාලනය සහ මීමැසි පාලනය ආදිය හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම හුවමාරුව හරහා NADSA ව්‍යාපාරය තවදුරටත් සාර්ථක විමට හේතු සාධක විය.

1991 දෙසැම්බර් මස 7 වන දින නිකුත් කරන ලද අංක 678/ 15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින්

මෙලෙස ක්‍රියාත්මක වු නැඩ්සා ආයතනයෙහි නිල නාමය ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (හදබිම අධිකාරිය) ලෙස සංශෝධනය කරන ලදී. ඒ සමඟ කෑගල්ල හා මහනුවර යන දිස්ත්‍රික්කවලට පමණක් සීමා වූ අධිකාරියේ සංවර්ධන බල ප්‍රදේශ නුවරඑළිය, මාතලේ, රත්නපුර, බදුල්ල, කෑගල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වලටද ව්‍යාප්ත කර ඇත. තවද මෙම සංශෝධනය සමඟ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් සංවර්ධනය වෙනුවට රජයේ විවිධ අණපනත් මගින් ගොවීන්ට ලබා දෙන ඉඩම් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත. ආරම්භක අවධියේ දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ලැබුණද පසුකාලීනව මෙම ව්‍යාපෘතිය මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව 1995 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරය විසින් අධිකාරිය වෙත වෙන් කරනු ලබන වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන මත වාර්ෂික ඉලක්කගත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

අතීතයේ සිටම කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ක්‍රියාත්මක වු ශ්‍රී ලංකා හදබිම අධිකාරිය 2017 මාර්තු 16 දින නිකුත් කරන ලද 1958/ 7 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කරන ලදී. මෙම පරිවර්තනය සමඟම අධිකාරියේ ආරම්භක ගැසට් නිවේදනය සංශෝධනයට ලක් කිරීමටත්, කාලීන ලෙස වැදගත් වන නව සංශෝධන ප්‍රවේශයන් හඳුනාගැනීමටත්. දිවයිනේ හඳුනාගත් ප්‍රදේශ වලට පමණක් සීමා වූ අධිකාරියේ සංවර්ධන

වැඩසටහන් දීප ව්‍යාප්ත වැඩසටහන් බවට පත් කිරීම සඳහාත් මෙම සංශෝධනය දී අවධානය යොමු විය.

ඒ අනුව 2017 වර්ෂයේ ජුලි මස 7 වන දින නිකුත් කරන ලද 2026/ 45 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ඉහත සංශෝධනයන් සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව පළමු ගැසට් නිවේදනයේ පවතින අනන්‍යතාවය එලෙසම ආරක්ෂා කරමින් නව සංශෝධනයක් සිදු කර ඇත. ඒ අනුව වාණිජ කර්මාන්ත ප්‍රවර්ධනය හා විදේශීය කෘෂි ආයෝජකයන් දිරිගැන්වීම, කෘෂිකාර්මික ආයෝජන සඳහා තාක්ෂණය සැපයීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කෘෂිකර්ම ආයෝජකයන් විසින් සිදුකරනු ලබන පශු සම්පත් සංවර්ධනය, බෝග වගාව සඳහා පහසුකම් හා සේවා සැපයීම ආදේශ කොට ඇති අතර අධිකාරියේ සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්ත කර ඇත.

වර්තමානයේදී අධිකාරියේ ව්‍යාපෘතින් මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් මූලික කොට ගෙන ක්‍රියාත්මක කරයි. අධිකාරියේ ප්‍රමුඛතම සංවර්ධන වැඩසටහන් වන්නේ පාංශු සංරක්ෂණ වැඩසටහන් සහ දිය බෙත්ම කළමනාකරණ වැඩසටහන්, කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන්, භෝග විවිධාංගීකරන වැඩසටහන් සහ අතිරේක ආහාර බෝග ප්‍රචලිත කිරීමේ වැඩසටහන් වේ. මෙම සියලුම වැඩසටහන් සඳහා නව්‍ය තාක්ෂණික දැනුම ගොවීන් වෙත බෙදා හැරීම අධිකාරියේ කේෂත්‍ර නිලධාරීන් හරහා සිදු කෙරේ.

## 3. ව්‍යාපෘතියේ අරමුණු

1. මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්ගේ කොම්පෝස්ට් නිෂ්පාදනය සහ කාබනික කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීම.

2. කෘෂිකර්මාන්තයේදී රසායනික පොහොර භාවිතය අවම කිරීම සහ ඒ සඳහා වැය වන පිරිවැය අවම කිරීම.

3. මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන් වල කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යවසායකයින් 60 දෙනෙකු බැගින් බිහි කිරීම.

4. දේශීය වශයෙන් රසායනික පොහොර සඳහා වන ඉල්ලුම අවම කිරීම සහ කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම.

5. වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ගොවී ජනතාව අභිප්‍රේරණය කිරීම.

## 4. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය

මෙම කොම්පෝස්ට් නිෂ්පාදන නියමු ව්‍යාපෘතිය මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන් ඉලක්ක කර ගනිමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී කොම්පෝස්ට් පොහොර වාණිජ නිෂ්පාදනය සඳහා කැමැත්තක් දක්වන ගොවීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගැනීම මූලික අදියර වශයෙන් සිදු කෙරේ. මේ සඳහා අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ව්‍යාපෘතිය පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු සහ ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වලදී සිදු කර ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම නියමු ව්‍යාපෘතිය සඳහා ඒක් ඒක් දිස්ත්‍රික්කයෙන් ප්‍රතිලාභීන් 20 දෙනෙකු බැගින් තෝරා ගෙන එම ප්‍රතිලාභීන් කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීම සිදු කෙරේ.

මෙලෙස තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් 60 දෙනා හට ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් හරහා කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා වන න්‍යායාත්මක දැනුම ලබාදීමට අපේක්ෂා කරන අතර ප්‍රායෝගික පුහුණු වැඩසටහන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන මාකඳුර කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකයේ සිදු කිරීමට සැලැසුම් කර ඇත. එහිදී කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා භූමිය තෝරා ගැනීම, කොම්පෝස්ට් නිෂ්පාදනයේ පියවරයන්, කොම්පෝස්ට් නිෂ්පාදනයේ විද්‍යාත්මක පසුබිම, කොම්පෝස්ට් නිෂ්පාදනය හරහා තවදුරටත් සිදු කරන අගය එකතු කළ නිෂ්පාදනයන් සහ අලෙවි ක්‍රියාදාමයන් පිළිබඳ පුළුල් දැනුමක් නව ව්‍යවසායකයින් හට ලබාදීමට අපේක්ෂා කෙරේ.

<u>මෙම ව්‍යාපෘතිය හරහා තෝරා ගන්නා සියළුම ප්‍රතිලාභීන් හට ලැබෙන භෞතික ප්‍රතිලාභ</u>

- කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පොලිතින් (ප්‍රොපගේටර් පොලිතින් -ගේජ් 500)
- උපකරණ කට්ටලයක් (උදා: උදැල්ලක්, උදළු මුල්ලුවක්, සවලක්,තාච්චියක් සහ රේක්කයක්)
- නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් ඇසිරීම සඳහා පොලිතින් මළු

(කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය සහ මානව සම්පත ප්‍රතිලාභීන් විසින් සපයා ගත යුතු වේ. )

මෙම කොම්පෝස්ට් නිෂ්පාදන රාජ්‍ය ලාංඡනය යටතේ "සරුබිම" යන සන්නාම නාමය හරහා වෙළඳපලට හඳුන්වා දීමට ව්‍යාපෘතිය හරහා අපේක්ෂා කරන අතර ඒක් ඒක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ ආරම්භ කිරීමට නියමිත මධ්‍යම පැල තවාන් සහ අනෙකුත් පැල තවාන් වල මෙම නිෂ්පාදන අලෙවි කිරීමට සැලැසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය හරහා වර්ෂයකදී ආසන්න වශයෙන් කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 1200000 ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමේ හැකියාව උදාවෙන අතර එමඟින් රසායනික පොහොර සඳහා වන ඉල්ලුම පහළ හෙලීමේ හැකියාව පවතී.

## 5. ව්‍යාපෘතියේ ක්‍රමවේදය

ව්‍යාපෘතිය හරහා කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යවසායකයින් 60 ඉලක්කගත දිස්ත්‍රික්කවලින් බිහි කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එහිදී වර්ෂයක් තුලදී කොම්පෝස්ට් පොහොර 120000 kg ප්‍රමාණයක් ව්‍යාපෘතිය අවසානයේදී නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන අතර නිෂ්පාදනය කරනු ලබන පොහොර රාජ්‍ය ලාංජනය යටතේ සරුබිම යන සන්නාම නාමය යටතේ මධ්‍යම පැළ තවාන් සහ අනෙකුත් පැළ තවාන් හරහා අලෙවි කිරීම සඳහා සැලැසුම් කර ඇත.

| | එක් ව්‍යවසායකයකු විසින් වසරකදී නිෂ්පාදනය කරන කොම්පෝස්ට් ප්‍රමාණය | ව්‍යවසායකයකයින් 60 දෙනෙකු විසින් වසරකදී නිෂ්පාදනය කරන කොම්පෝස්ට් ප්‍රමාණය |
|---|---|---|
| එක් කාර්තුවකදී නිෂ්පාදනය කරන කොම්පෝස්ට් ප්‍රමාණය | 5000 kg | 300000 kg |
| එක් වර්ෂයකදී නිෂ්පාදනය කරනු ලබන සම්පූර්ණ කොම්පෝස්ට් ප්‍රමාණය | 20000 kg | 1200000 kg |
| වර්ෂයකදී නිෂ්පාදනය සිදුකරනු ලබන සම්පූර්ණ කොම්පෝස්ට් පැකට් ප්‍රමාණය (10 kg පැකට්) | 2000 | 120000 |

## 6. ඉලක්කගත කණ්ඩායම් හෝ ප්‍රතිලාභීන්

ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභීන් වන්නේ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා තෝරා ගන්නා ලද සුළු ව්‍යවසායකයින් වන අතර මේ හරහා ප්‍රදේශයේ බොහෝ දෙනා හට රැකියා අවස්ථා උත්පාදනය වීම සිදු වේ.

## 7. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක සැලැස්ම

ඇමුණුම 01 මගින් දක්වා ඇත

## 8. ව්‍යාපෘතියේ කාල රාමුව

| | ක්‍රියාකාරකම | කාලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජන. | පෙබ | මාර්තු | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| 01 | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම | | | | | | | | | | | | |
| 02 | න්‍යායාත්මක පුහුණු පැවැත්වීම | | | | | | | | | | | | |
| 03 | ප්‍රායෝගික පුහුණු පැවැත්වීම (නේවාසික පුහුණු) | | | | | | | | | | | | |
| 04 | පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාගැනීම | | | | | | | | | | | | |
| 05 | කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පොලිතින් සහ උපකරණ කට්ටල ලබාදීම | | | | | | | | | | | | |
| 06 | කොම්පෝස්ට් පොහොර ඇසිරීම සඳහා ඇසුරුම් ද්‍රව්‍ය ලබාදීම | | | | | | | | | | | | |
| 07 | නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර සහතික කිරීම | | | | | | | | | | | | |
| 08 | ව්‍යාපෘතියේ මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු | | | | | | | | | | | | |

## 9. අපේක්ෂිත නිමැවුම හා ප්‍රතිඵල

| **නිමැවුම** | **ප්‍රතිඵල** |
|---|---|
| 2021 වර්ෂය අවසානයේදී කොම්පෝස්ට් පොහොර 1200000 kg ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම | රසායනික පොහොර භාවිතය අවම වීම සහ කාබනික වගාව දිරිමත් කිරීම. |

## 10.අවධානම සහ අඩමානය

ව්‍යාපෘතිය සඳහා කාලගුණික සහ දේශගුණික තත්වයන් ගේ බලපෑම් නිසා අපේක්ෂිත තරම් උසස් ගුණාත්මයේ නිෂ්පාදනයක් සිදු කිරීමට නොහැකිවීමේ අවධානමක් ඇති විය හැක

## 11.ව්‍යාපෘතියේ යාවත්කාලීන පිරිවැය

| අනු අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය | ආයතනික දායකත්වය | මුළු පිරිවැය |
|---|---|---|---|---|
| 1. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම | ප්‍රතිලාභීන් 60 | 0.75 | 0.75 |
| 2. | න්‍යායාත්මක පුහුණු පැවැත්වීම | ප්‍රතිලාභීන් 60 | 0.01 | 0.01 |
| 3. | ප්‍රායෝගික පුහුණු පැවැත්වීම (නේවාසික පුහුණු) | ප්‍රතිලාභීන් 60 | 0.30 | 0.30 |
| 4. | පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාගැනීම | | 0.02 | 0.02 |
| 5. | කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පොලිතීන් සහ උපකරණ කට්ටල ලබාදීම | උපකරණ කට්ටල 60 | 0.90 | 0.90 |
| 6. | කොම්පෝස්ට් පොහොර ඇසිරීම සඳහා ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රතිලාභීන් හට ලබාදීම | පොලිතීන් ඇසුරුම් 120000 | 4.20 | 4.20 |
| 7. | නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර සහතික කිරීම | | 0.20 | 0.20 |
| 8. | ව්‍යාපෘතියේ මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු (3%) | | 0.19 | 0.19 |
| | මුළු එකතුව | | 6.57 | 6.57 |

## 12.ව්‍යාපෘති ඇගයීම

ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් ගේ සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශය මත සිදුවන අතර පෙර ඇගයීම් කටයුතු අධිකාරියේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සිදු කරයි. ව්‍යාපෘතියේ සමස්ථ ඇගයීම් කටයුතු පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය, ගෘහස්ත සත්ව පාලනය, සුළු ආර්ථික බෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හරහා සිදු කෙරේ.

## 13.ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම

මෙම ව්‍යාපෘතිය හරහා කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා නාගරික අපද්‍රව්‍ය සහ අනෙකුත් කැලිකසළ ආදීය යොදා ගන්නා හෙයින් පරිසර දූෂණය පහළ යාම සිදු වේ.

## 14.ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ව්‍යාපෘතිය හරහා ගෘහනියන් මෙම කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා උනන්දු කරවීම හරහා ඒ ආශ්‍රිත අතිරේක ආදායම් මාර්ග උත්පාදනය කරමින් ආර්ථික ශක්තිමත් කිරිමට අපේක්ෂා කෙරේ.

## 15.ව්‍යාපෘතියේ තිරසාර බව

මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්යන් ගේ ක්‍රියාත්මක කර අනෙකුත් දිස්ත්‍රික්කයන් සඳහාද ව්‍යාප්ත කිරීම සිදු කිරීම හරහා ව්‍යාපෘතියේ තිරසාර බව පවත්වා ගත හැක.